astrologer.lk
Astrologer - Prabhath Karunanayaka

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කුකේ<br>රවබුශුශ | 1 | 12<br>11 | | කු 2 | ශ | බු<br>රාගු |
| 4 | කන්‍යා<br>ලග්නය | 10 | | ශු | කන්‍යා<br>නවාංශ | 10 |
| ගු<br>6 | 7 | රා 9 | | කේ<br>රව | 7 | 9<br>8 |

Date: XXXXX
Time: XXXX am
Time Zone: 5:30:00 (East of GMT)
Place: 80 E 06' 00", 7 N 07' 00"
Wathupitiwala, Sri Lanka

Lunar Yr-Mo: Krodhana - Karthika
Tithi: Amavasya (Ra) (20.99% left)
Vedic Weekday: Wednesday (Bu)
Nakshatra: Jyeshtha (Bu) (47.98% left)
Yoga: Soola (Gu) (77.07% left)
Karana: Naga (Gu) (41.99% left)
Hora Lord: Surya (5 min sign: Mith)
Mahakala Hora: Surya (5 min sign: Mith)
Kaala Lord: Sukra (Mahakala: Sukra)
Sunrise: 6:11:16 am (December 11) Sunset: 5:54:18 pm (December 11)
Janma Ghatis: 49.8225 Ayanamsa: 23-38-42.7 Sidereal Time: 7:19:24
Vimsottari Dasa: Maha Dasas:
Budh: 1985-12-15 - 1994-02-05
Ket: 1994-02-05 - 2001-02-05
Sukr: 2001-02-05 - 2021-02-05
Sury: 2021-02-05 - 2027-02-06
Chan: 2027-02-06 - 2037-02-05
Mang: 2037-02-05 - 2044-02-06
Rah: 2044-02-06 - 2062-02-06
Guru: 2062-02-06 - 2078-02-06
Sani: 2078-02-06 - 2097-02-06

| Body | Longitude | Nakshatra | Pada | Rasi | Navamsa |
|---|---|---|---|---|---|
| Lagna | 26 Kanya 45' 42.43" | Chit | 2 | Kanya | Kanya |
| Surya - AK | 26 Vrisch 07' 16.79" | Jye | 3 | Vrisch | Kumbh |
| Chandra - AmK | 23 Vrisch 36' 07.73" | Jye | 3 | Vrisch | Kumbh |
| Mangala - DK | 4 Tula 33' 12.01" | Chit | 4 | Tula | Vrisch |
| Budha - GK | 6 Vrisch 01' 53.70" | Anu | 1 | Vrisch | Simh |
| Guru - BK | 20 Makar 35' 35.60" | Srav | 4 | Makar | Kark |
| Sukra - MK | 16 Vrisch 49' 50.87" | Jye | 1 | Vrisch | Dhanu |
| Sani - PK | 9 Vrisch 17' 35.55" | Anu | 2 | Vrisch | Kanya |
| Rahu - PiK | 13 Mesh 14' 41.95" | Aswi | 4 | Mesh | Kark |
| Ketu | 13 Tula 14' 41.95" | Swat | 2 | Tula | Makar |

ඉදිරිපත් කිරීම -
ප්‍රවීණ ජ්‍යොතිෂවේදී ප්‍රභාත් කරුණානායක
www.astrologer.lk
33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

රැකියා කටයුතු හා සමස්ත ජීවිතය

ඔබගේ ජන්ම පත්‍රයේ රැකියා පිලිබඳව නිවේදනය වන දසවැන්න හිමි වන්නේද ලග්නාධිපති වු බුධ වෙතමය.එම බුධ තෙවැන්න මත යෙදෙන අතර තෙවැන්න මත ග්‍රහයන් පස්දෙනෙකු යෙදී ඇත.තෙවැන්න හිමි කුජ ධනස්ථානය මතයි.නවාංශකයද කන්‍යා විම තවදුරටත් ජීවිතයට යහපත් බවක් ,බලවත් බවක් යෙදෙන බව නිවේදනය කරනු ඇති.

ඔබ යම් ආකාරයක දක්ෂතා හිමියෙකි.සංනිවේදන හැකියාවන් ඇත්තෙකි.තර්කාණුකූලව සිතන්නෙකි.සෙසු අයට නිසි උපදේස සපයන්නෙකි.ඔබට ගැලපෙන රැකියා හෝ ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක්වෙන අතර එකක් හෝ කිහිපයක යෙදිය හැකියි.බොහෝවිට ඔබ රැකියා හෝ ව්‍යාපාර කිහිපයක යෙදෙන්නෙක් විය හැකියි.මුද්‍රණ ,පරිගණක ,විදුලි සංදේශ ,විදුලිය සම්බන්ධ කටයුතු ,අධ්‍යාපන කටයුතු ,විදේශ සම්බන්ධ කටයුතු ,තාක්ෂණික කටයුතු ,මුල්‍ය කටයුතු ,නියෝජිත කටයුතු ආදිය ඔබට වඩාත් ගැලපෙන ක්ෂේත්‍රයන් වනු ඇති.සෞඛ්‍ය ,මහජන සුවසහන කටයුතු ආදියද ඔබට වඩාත් ගැලපෙන කටයුතු අතර වේ.මේ අතර එකක් හෝ කිහිපයක් පිලිබඳව ඔබ දැනටමත් යෙදි සිටින්නේ නම් ඒ පිලිබඳව විශේෂයෙන් දැන ගනිමට අවශ්‍ය නම් අප වෙතින් විමසිම් කල හැකියි.එසේම ඔබ ඉහත යම් ක්ෂේත්‍රයක නියුතු වුවද ඉහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහිත් අඩු වැඩි වශයෙන් දක්ෂතා යෙදේ.

ඔබගේ ජන්ම පත්‍රයේ නම වැන්න හිමි වු සිකුරු හා දසවැන්න හිමි බුධ එකරාශි ගතව තෙවැන්න මත යෙදීම ධර්මකර්මාධිපති නැමැති රාජයෝගය ජන්ම පත්‍රය තුල උදා වීමකි.ඔබට උසස් සමාජ ඇසුරක් හිමි වනු ඇති අතර උපන් තත්වයට වඩා දියුණුවක් යෙදේ.බොහෝවිට උසස් අධ්‍යාපනයක් කෙරෙහි අවස්ථාව යෙදේ.එසේ උසස් අධයාපනයක් නොලද්දේ නමුත් ඔබ සතුව ඥාණ ශක්තියක් සියුම් කල්පනා ශක්තියක් යෙදේ.ඔබට යහපත් රැකියාවක් පිලිබඳව අවස්ථාව යෙදේ.යහපත් නිවාස ,යාන වාහන හිමියෙක් වනු ඇත.

නමුත් මෙම ගත වන කාලය එතරම් ශුභදායක බවක් නොමැති විය හැකියි.සිතේ තරමක අවිනිශ්චිත තත්වයක් යෙදිය හැකියි.අනවශ්‍ය වියදිම් යෙදිමට ඉඩ ඇති මුත් සමහර වියදම් අනාගත ආයෝජනන් බවට පත් විය හැකියි.ඉන් ලාභ හිමි වන්නේ ඉදිරි අනාගතයේදී විය හැකියි.කරන කියන කටයුතු ආදියෙන් දියුණුව තරමක අඩු විය හැකි


33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

මුත් යම් යම් අවස්ථාවන් වලදී සහනකාරී තත්වයන්ද යෙදේ.මුදල් ආයොජනයට එතරම්ම යහපත් බවක් මෙම කාලයේදී නොපෙනන මුත් එවැනි අවස්තාවන යෙදේ නම් හොදින් අධ්‍යනයකින් පසුව එම කටයුතු ආදියෙහි යෙදීම යහපති.අනුමානයට කරන කටයුතු සඳහා මුදල් වැය කිරීමෙන් වැලකිය යුතු අතර ණයට දීමේදීත් සැලකිලි මත් වන්න.දේපොල මිලදී ගැනීම් ,ගේ දොර සෑදීම් වැනි කටයුතු සඳහා අයහපත් නොවන අතර මෙම කටයුතුවල යෙදීමේදී අපල පවතින බව අවබෝධයෙන් කටයුතු කරන්න.

දැනට උදාව පවතින විංශොත්තරී සිකුරු මහ දශාව 2001 .2.05 සිට 2021.2.05 දක්වා යෙදෙන අතර මෙම වසර 20 අවසනායේදී ජීවිතයේ ලෞකික දියුණුවක් සිදුව ඇති බව ඔබට අවබෝධ වනු ඇති.මෙහි අදහස මෙම සමස්ත වසර 20 පිලිබඳවම සැලකිය යුතු බවයි.මෙම වසර 20 තුල යෙදෙන සෙසු ග්‍රහයන්ගේ දශා ගෝචර නිසා යම් අශුබතා ,බලාපොරොත්තු කඩවීම් යෙදුනද සමස්ත දශාව යහපත් වනු ඇත.මෙහිදි අතීතයද සිහිපත් කල යුතුයි.සිකුරු මහ දශාව ඔබට ශුභපල පිරිනැමීමට සුදානම්ව සිටියත් සෙනසුරු ලග්න ඒරාෂ්ඨක තත්වය 2006. නොවැම්බර් 15 සිටම ක්‍රියාත්මක බැවින් මෙකී ශුබපල යම් ප්‍රමාණයේ හීනත්වයට පත්විය හැකියි.නැතහොත් ලැබිම් ප්‍රමාද කල හැකි අවස්ථා යෙදෙනු ඇත.ඔබ හිමි විය  යුතු යම් යම් දේ වෙනත් අයවෙත යොමු වනු ඇති.රැකියා ආදියෙදී නිසි ඇගයීම් යම් අවස්ථාවලදී හිමි නොවිය හැකියි.

දැනට පවතින අපලකාරී තත්වය 2020 ජනවාරි 24 දක්වා ඔබ වෙත යෙදීමට නියමිත වන අතර එදිනෙදා කටයුතු වලදී සිදුවිය හැකි සිත්වේදනා ,අලාභ ,අහිමි වීම ,අනතුරු ,රෝගී තත්වයන් ආදියට උපේකෂාවෙන් මුහුණ දෙමින් කටයුතු කරන්න.මෙම අපලකාරී තත්වය මත යෙදෙන අශුබතා මඟහරවා ගැනිම සඳහා සුදුසු වත් පිලිවෙත් පහත දක්වා ඇත.

අපලකාරී තත්වය නිමාවීමත් පසුව සහනකාරී තත්වයක් සෙමින් ඔබට හිමි විය හැකියි.මෙම අපලකාලය තුලදී අනතුරු ,රෝග පීඩා,ධන හානි ,සිත් වේදනා යෙදිය හැකි නිසා අවබෝධයෙන් හා උපේක්ෂා වෙන් කටයුතු කරන්න.

ඉදිරිකාලය වන විටත් යම් ශුභපල හිමි වන අවස්ථාවලදී අපලකාරී තත්වයන් යෙදෙන බවට නිවේදනය වේ .නමුත් වත් පිලිවෙත් ආදියෙන් සහන කාරී තත්වයන් යෙදනු ඇති.පහත දැක්වෙන වත් පිලිවෙත් 2020 තෙක් භක්තිමත්ව සිදුකල යුතු අතර නැවත 2027 ජුනි 9 සිට 2030 අප්‍රේල් දක්වා සිදුකිරීමද යහපති.

සාරාංශ වශයෙන් සැලකීමේදි අපලකාලයන්හිදී අශුතා යෙදෙතත් ඔබට සමස්තයක් වශයෙන් සැලකීමේදී යහපත් ජීවිතයක් හිමි වන බවට ජන්ම පත්‍රයේ නිවේදනය වනු ඇති.

ඉදිරිපත් කිරිම -
ප්‍රවීණ ජ්‍යොතිෂවේදී ප්‍රභාත් කරුණානායක
www.astrologer.lk
33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

විවාහය සඳහා බොහොවිට ප්‍රේමය මුල්විය හැකියි.සෙම් සහිත රොග ආදියෙන් තරමක් ප්‍රවේශම් වන්න.දත් හා,හිස ආශිත පීඩාන් යෙදේමට ඉඩ ඇත.කතාබහ කිරිමේදි සැලකිලිමත් විය යුතුයි යම් අවස්ථාවලදී ඔබගේ වදන් සෙසු අය රිදවිය හැකි අවස්ථා යෙදිය හැකියි.

ඔබගේ ජන්ම පත්‍රයේ ග්‍රහයන් එක් පසෙක රාහු කේතුට මැදිව සිටින ආකාරයක් යෙදෙතත් කුජ අංශක ගනනින් රාහු කේතු අක්ෂයෙන් මෙපිට විම මත කාල සර්ප යෝගයක් නොයෙදනු ඇත.එමගින් අදාවන කුජ දීප්ත යෝගය ඔබ වෙත ධෛර්යමත් බවක් හිමි කර දිය හැකි අතර ජීවිතයේ දියුණුව බොහෝ විට ඔබගේ ස්ව ශක්තිය මත සිදුවිය හැකියි.

අපල සඳහා වත් පිලිවෙත්

1 බෝධි පුජා පවත්වා විෂ්ණු - කතරගම - සුමන සමන් - ගම්භාර - පත්තිනි ආදි සියලුම දෙවියන්ට පින් අනුමෝදනාකර සියලුම දෙවිින්ගේ දේව ආශිර්වාදයෙන් තම අපල දුරු වී සෙතක් ශාන්තියක් ලැබේවා යැයි ප්‍රාර්ථනා කිරීම යහපත්ය.

2 සෙනසුරාදා දිනවල උදේම ගිතෙල් මිශ්‍ර කරන ලද කිරිබත් ගුලි නමය බැගින් කපුටන්ට දන් දීම යහපති.

3 ගුණ යහපත් වැඩිහිටි අයට සුදුසු සංග්‍රහයක් කර ඔවුන්ගේ ආශීර්වාදය ලබා ගැනීම යහපත් ය.( වැඩිහිටි නිවාසයකට දානයක් දීම වුවත් යහපත් ය .)

4 නිල්මහනෙල් මල් හා රතු නෙලුම් බෝධියකට පුජා කරන්න.

5විෂ්ණු දෙවියන් වෙතට වසර 2020 තෙක් බාරවී බාරය වශයෙන් වර්ෂයට අළුත් කරවා ගන්න.නැවත් 2027 සිට 2030 දක්වා බාර වන්න.

6 නිවසේ බුදුන් වහන්සේට මල් - සුවඳ - පහන් පුජා කර සියලුම දෙවියන්ට පිං අනුමෝදනා කර සියලුම දේවියන්ගේ ආශිර්වාදයෙන් සෙතක් ශාන්තියක් ලැබේවා යනුවෙන් ප්‍රාර්තනා කිරීම යහපත් ය.

7 නිවසේ කරණීය මෙත්ත සුත්‍රය ,ජය පිරිත , අභිසම්භිදාන සුත්‍රය සද්ගායනා කිරීම යහපති.

8 රැකියා කටයුත්තෙන් සහනය පිනිස ගම්බාර දෙවියන් වෙත බාරයක් වන්න.බෝධි පුජා හා තෙරුවන් වෙත මල් පහන් පුජා පවත්වා ගම්බාර දෙවියන්ට පිං අන්මෝදනා කර මෙම ප්‍රශ්නයෙන් සහනය ලබා දෙනු ලෙස ප්‍රාර්තනය යහපති.

ඉදිරිපත් කිරිම -
ප්‍රවීණ ජ්‍යොතිෂවේදී ප්‍රභාත් කරුණානායක
www.astrologer.lk
33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

9 විෂ්ණු ,කතරගම්, ගම්බාර, සත්පත්තිනි දෙවි දේවතාවන් නිතර සිහිකරමින් තමට ආරක්ෂාව ,පිහිට ලබා දෙන ලෙස ඉල්ලා සිටින්න.

10 ඕම් ත්‍රෙයම්බකම් යජාමහේ - සුගාඩිම් පුෂ්ඨී වර්ධනං -

උරුවාරු කර්‍මම බන්ධනාත් - මෘත්‍යෙර් මුක්ෂීය මාමෘතාක්

අපගේ වෙබ් අඩවියෙන් මෙම ස්ත්‍රොතය ශ්‍රවණය කර නිසි උච්චාරණය දැන දවසේ ඕනෑම අවස්ථාවකදී නිසි ගෞරවය සහිතව ශිව දෙවියන් සිහිකර කියවීම සුදුසුයි.

11 සෙත් කවියක් විෂ්ණු දෙවියන් කතරගම දෙවියන් සඳහා ලියවා කියවීම ශුභයි.

12ආබාධිත යාචක අයට තමාට හැකි අවස්ථා වලදී ආහාර හෝ සුදුසු යමකින් සංග්‍රහ කරන්න

13දරුවන් සිටින ආර්ථික අපහසතා ඇති පවුලකට ඔබගේ හැකි ආධාරයක් ලබා දෙන්න

14 කුඩා දරුවන් සඳහා සංග්‍රහ පැවැත්වීම ,දරුවන් ඇසුරේ සිටීම ,දරුවන් සිටින අනාත නිවාස ආදියට උපකාර ලබා දීමද සුදුසුයි.

"බුදු සරණින් සියලුම දෙවි පිහිටෙන් ඔබගේ සියලු අපල දුරුවී ඔබට සෙතක් ශාන්තියක් යහපතක් ම වේවා".යනුවෙන් අපිද ප්‍රාර්තනය කරමු


33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com